
13

# පහුරක ගිය ගමනක්

"සේතන් අයියේ, මේ සැරේ පහුරු යන කොට මාවත් කොහොම හරි එක්ක යන්න ඕනෑ" ගං ඉවුරේ ඉඳගත් මම කීවෙමි.

"එව්ව අපි දන්නෙ නෑ. අවසර ගන්න ඕනැ කොරනේලිස් උන්නැහැගෙනුයි" සේතන් අයියා ඇල්බීසියා කඳක ගැටයක් අත් පොරොවෙන් සසිමින් කීවේ ය.




අපේ ගමේ සිට කැලණි ගඟ දිගේ පහුරකින් කොළඹ යාමට දවසක් දෙකක්වත් ගත වෙයි. මේ ගමන විසිතුරු වූත් ත්‍රාසජනක වූත්, රසවත් වූත් අත්දැකීම්වලින් පිරී ඇති බව මා දැන ගත්තේ පහුරුකාරයන් කියන කතා ඇසීමෙනි. එහෙයින් පහුරක නැඟී ගඟ දිගේ කොළඹ යාම මට දැනුණේ ඉතිහාස පොතේ ඇති කොලොම්බස්ගේ නාවික ගමන මෙනි. එවන් ගමනක් මා විසින් ද යා යුතු යැයි මගේ සිත නිතර කියයි.

පහුරු ගමනට මට අවසර ලැබිණ. "කොලුවගෙත් ආසාව නොවැ! හැම දූ ම කරදරේ. පහුරෙ යන්ඩ ද, පහුරෙ යන්ඩ ද අහනවා. කෝකටත් සේතන් සිංඤෝ කොලුව ගැන හොඳට

බලාගන්ට ඕනෑ.'' බාප්පා කීවේ ය.

අප පිටත් ව යන සැටි බැලීමට සුමනසිරිත්, පොඩ්ඩේත් ගං ඉවුරට පැමිණ සිටියහ. බාප්පා ද කල් තියා ම පැමිණ සිටියේ ය. මගේ මහත් විස්මයට මෙන් ගෙදර සිටින ජිමී බල්ලා ද ගං ඉවුරට දුව ආවේ ය.

''විජේපාල පහුරෙ යන විත්තිය බල්ලට ඉව වැටිලා'' සුමනසිරි කීවේ ය.



අඩි විස්සක් තරම පළල, අඩි සියයක් තරම දිග පහුර කොළඹ යාමට සූදනම් ය. පහුර දෙපැත්තේ උණ ලී මිටි මිටි ඇත. ඒ මැද්දේ ඇල්බීසියා කඳන් පෙළ ගස්වා එකිනෙකට ඈඳා ඇත. කඳන් එකිනෙකට ඈඳීම සඳහා කොරස වැල් සහ දෙකට පැලූ බට දඬු යොදා ගනු ලැබෙයි. පහුර මැද්දේ කුඩා පොල්අතු පැලකි. පැල තුළ හට්ටි මුට්ටි ද හාල්, පොල්, තුනපහ ද එළවළු, කරවල ද මඤ්ඤොක්කා ද ඇත. පැලෙන් පිටත ලී කඳන් මත තාර බැරල් පියනක් තබා ඒ මත ගල් තුනක් තබා ඇත්තේ ළිපක් වශයෙනි.

''අනික් දවසෙ අපි දෙන්නවත් එක්ක යන්න ඕනෑ'' පොඩ්ඩේ මගේ කනට කර කීවේ ය. මම ''හා'' කීවෙමි.

පහුරට නැඟ රිට අතට ගත් සේතන් අයියා දැත් එකිනෙක අතුල්ලා රිටට වැන්දේ ය. ඉක්බිති ව ජයසේකර ද එසේ ම කළේ ය. ''විජේපාලත් නඟින්න'' සේතන් අයියා කීවේ ය. මම ද පහුරට නැංගෙමි. ස්වල්ප වේලාවකින් පහුර පිටත් වූයේ මැදගොඩ දේවාලය දෙසට හැරී සේතන් අයියා වැන්ද පසු ය.



පහුර ගඟ පහළට ඇදී යයි. දෙකෙළවරේ සිට ගත් සේතන් අයියා සහ ජයසේකර රිටිවලින් පහුර ගඟ මැදට ගනිති. කාලයකින් නොවැස්ස බැවින් ගඟේ වතුර නිල් පැහැති ය. ගඟට වැටෙන ඇළක වතුර පමණක් බොර වී ඇත. මා සිතුවේ ඇළ පැත්තට වැසි වැටී ඇත කියා ය.

ගඟ දෙපස හෙවණ වුව ද ගඟ මැදට නම් අව්ව වැටෙයි. පහුර ගමන් කරන්නේ ගඟ මැද නිසා අපේ ඇඟපත ඉර එළියෙන් බැට කයි.

"දුම්බුකඩුව ළං වෙනවා. විජේපාල පහුර හොඳට අල්ලගෙන බය නැතුව ඉන්න ඕනැ." සේතන් අයියා කීවේ ය. මම පහුර හොඳින් අල්ලා ගතිමි.

දුම්බුකඩුව ගැන මා අසා තිබුණා මිස දක තිබුණේ නැත. නිදහසේ තැන්නේ ඉඩකඩ ඇති ව ගලා ආ කැලණි ගඟ මේ හරියේ දී ගල්තලා දෙකකට මැදි ව පටු වී ඇකිළී ගමන් කරයි.

දෙපසේ වතුර කඳ රැලි නඟා ගලේ හැපී උඩ පැන දඩිං හඬින් බිඳී වැටෙයි. මෙතැනේ දී පහුරට ද වතුර වදියි. පහුර කැරකී විසි කරන අවස්ථා ද සුළි ගසා දිය යට ගෙන ගොස්

ගල් පර්වත අස්සේ ගසන අවස්ථා ද ඕනෑ තරම් ඇතැයි පහුරු කාරයෝ කියති.

කැලණි ගඟේ ත්‍රාසජනක අත්දැකීමට මුහුණ දෙන අටියෙන් මම පහුර වැරයේ අල්ලා ගතිමි. පහුර දුම්බුකඩුවට සේන්දු වන විට මා තුළ තරමක තිගැස්මක් ඇති වුව ද මම නොසැලී සිටියෙමි. දෙපසින් හිර වූ ගඟේ දඩිං හඬින් නැඟෙන රළ, පහුරට උඩින් ගසන්නට විය. පහුර එක් කොණකින් යට ගියේ ය. මම පහුරේ දිගාවී වැරයේ ලී කඳක් අල්ලාගෙන සිටියෙමි. පහුර වේගයෙන් කැරකී උඩට මතු විය.

"දැන් ඉතින් හරි," ජයසේකර සැහැල්ලුවෙන් කීවේ ය.

පහුර ගඟ පහළට ඇදී ගියේ ය. ගඟ දෙපස ඇති උණ



පඳුරුවල අගිස් ගඟට නැමී ඇත්තේ කර උස්සා අප දෙස බලා සිටින මිනිසුන් මෙනි. ඒ උණ පඳුරුවල වැසූ කොකුන්ගේ සුදු පෙනෙන්නේ ඉගිළෙන විට ය. විශාල කොට්ටන් ගස්වල එල්ලුණු වවුලන් නගන හඬ චිරි චිරිස් හඬින් ඇසේ. උන් පියඹා යන්නේ හෙලිකොප්ටර් යානා පරිද්දෙනි. කදුරු, කිරළ, දෙඹ, ඇහැළ, හික් ආදී ගස්, ගඟ දෙපස සිටින මුරකරුවන් වැන්න. ඇතැම් ගසක අත්තක් ගඟ දියෙහි ගැවෙන්නේ ගඟ හා රහස් කොඳුරන ලෙසිනි. පස සෝද යාම නිසා සමහර ගසක මුල් අපට පෙනෙන්නේ අඩු විහිද ගත් දැවැන්ත සතකු මෙනි.

පහුරේ පැලෙහි බත් මුල් තිබුණ ද මට තව ම බඩගිනි නැත. වෙලාව දවල් දොළහ පසු වී ඇතැයි හැඟෙන්නේ මුදුන් ඉර බටහිරට හැරුණු හෙයිනි.

“දවල් වුණා, විජේපාල. බත් කෑව නං” සේතන් අයියා කීවේ ය.

“පස්සෙ කනවා.”

දෙතුන් වරක් පෙරැත්ත කළ සේතන් අයියා “එහෙනං අපි තුන් දෙනා ම කමු” යි කීවේ ය. පතුරු ගසන ලද කොළපත්වල බැඳ තිබූ ඒ බත් ගෙඩි තුන ම එක ප්‍රමාණයේ විය. මා එතෙක් කෑ රස ම බත් වේල ද එයයි. කොතෙක් රස ද යත් මම මුළු බත් ගෙඩිය ම කෑවෙමි. සිංහල හාලේ බතත් පොලොස් ගැට මාළුවත් හාල්මැස්සන් බැදුමත් පොල් සම්බෝලත් බතෙහි විය.

කෙමෙන් අඳුර වැටෙයි. ගඟ දිය නිසල වෙයි. රෑටත් පහුරේ ගමන් කිරීමට මා ආශා කළ ද රෑ පහුරු නොයන බව ජයසේකර කීවේ ය. හොඳින් වැල්ල ඇති තැනෙක පහුර නතර කෙරිණ. ජයසේකර හනික ඉවුරට පැන ලොකු දෙඹ ගහකට කඹයක් දමා පහුර ගැට ගැසුවේ ය.

අඳුර වැටී ගෙන එද්දී රෑහැයියන්ගේ හඬ ගං ඉවුරෙන් ඇසෙන්නට විය. වවුලන්ගේ ද බස්සන්ගේ ද හඬ අප සිටි තැනට නුදුරේ ගස්වලින් ඇසිණ. නරි රංචුවකගේ හූ කීම ද ඒ සමග නැඟුණේ ය.

වැලිතලාවේ එක් තැනක තුබූ මඤ්ඤොක්කා හැළිය දුම් දමනු ලන්තෑරුම් එළියෙන් පෙනේ. ලන්තෑරුම ඇත්තේ වැල්ලේ කෝටුවක එල්ලා ය. තවත් මෙවැනි ම එළි දෙකක් වැල්ලේ තැන තැන පෙනේ. අනෙක් හැම තැන ම අඳුරු ය.

වරින්වර හමා ආ සුළඟ නිසා උණ පඳුරු සර සර ගායි. ඉවුර දිගේ දුව ආ සමහර කුඩා සත්තු ජබුඃ හඬින් දියට පනිති. ටික වේලාවකට පසු හඳ පායා ආවේ ය. රන් තැටියකින් කිරි ඇද හැලෙන්නා සේ සඳරැස් ගලන්නට විය. ඒ රැසින් නිසල ගඟ දිය ද රන් පැහැ ගත්තේ ය.



උලුප්පන ලද පොල් කැබලිත් අමු මිරිස් කරලුත් සමග මක්කොක්කා කෑ ජයසේකර වෙනත් පහුරුකාරයකු සමග තරගයට සීපද කියන්නට විය. වැල්ලේ වැතිර ගත් මට නින්ද යන තෙක් ම ඒ සීපද ඇසිණ.

***සෝමවීර සේනානායක***
***- ගඟ අද්දර කැලේ -***

## අවබෝධය

1. පහුර සාදා තිබූ ආකාරය විස්තර කරන්න.
2. පහුර පිටත් වන අවස්ථාව බැලීමට ගං ඉවුරට පැමිණ සිටි අය නම් කරන්න.
3. විජේපාල දුම්බුකඩුවේ දී ත්‍රාසජනක අවස්ථාවකට මුහුණ පෑවේ ය. එම අවස්ථාව ඔබේ වචනයෙන් කියන්න.
4. දවල් දොළහ පසු වී තිබුණ ද විජේපාලට බඩගිනි දැනුණේ නැත. එහෙත් විජේපාල මුළු බත්ගෙඩිය ම කෑවේ ය. මෙසේ සිදු වන්නට ඇත්තේ කුමක් නිසා දැයි දී ඇති කරුණු අනුව බලන්න.
5. වගුවක් සාදන්න. පාඩමෙහි සඳහන් වන පුද්ගලයින්, සතුන්, ගස්වැල් සහ ආහාරපාන එහි ඇතුළත් කරන්න.

| **පුද්ගලයින්** | **ආහාරපාන** | **සතුන්/කුරුල්ලන්** | **ගස්වැල්** |
|---|---|---|---|
| සේතන් අයියා | බත් | වවුලන් | උණ ගස් |

## භාෂා ක්‍රියාකාරකම්

6. ගැළපෙන වචනය වරහන් තුළින් තෝරා හිස් තැන් පුරවන්න.

   i. ශෝකය ඇති කරන ..............................

   ii. ප්‍රීතිය ඇති කරන ..............................

   iii. පිළිකුල ඇති කරන ..............................

   iv. සිනා උපදවන .............................

   (ප්‍රීතිජනක විනෝදජනක ශෝකජනක
   ත්‍රාසජනක හාස්‍යජනක ජුගුප්සාජනක)

7. පාඩම නැවත කියවා එහි ඇති උපමා උපමේය වෙන් කර ලියන්න.

| උපමාව | උපමේය | සමාන බව හඟවන පදය |
|---|---|---|
| | | |

8. කළු අකුරින් යෙදී ඇති අප්‍රාණවාචී නාම පදවලට ගැළපෙන ආඛ්‍යාතය වරහන් තුළින් සොයා ලියන්න.

   i. කෙමෙන් **අඳුර** .......................

   ii. **පහුර** ගඟ පහළට ඇදී .......................

iii. රැහැයියන්ගේ **හඬ** ගං ඉවුරෙන් ඇසෙන්නට ......................

iv. **උණ පඳුරු** සර සර හඬ ......................

v. **සඳරැස්** ....................

(නභයි වැටෙති විය පැතිරෙයි ගියේ ය
නභති වැටෙයි වූහ පැතිරෙති ගියෝ ය)

9. පහුරක ගිය ගමන විස්තර කරමින් විජේපාල තම මිතුරකුට ලිපියක් යවයි. එම ලිපිය ලියන්න.

## පැවරුම්

1. කෙසෙල් පිති හෝ ලී කැබැලි ගෙන සෙල්ලම් පහුරක් සාදන්න.

2. පහුරේ ගොස් ආපසු පැමිණි විජේපාල තම අත්දැකීම සුමනසිරිට සහ පොඩ්ඩෝට විස්තර කරන ආකාරයෙන් කතාව කියන්න. ඉන් පසු ලියන්න.

3. i. ජයසේකර කියන්නට ඇතැ යි සිතිය හැකි පාරු සීපදයක මුල පදය මෙහි දක්වෙයි. ඉතිරි පද ලියා සම්පූර්ණ කරන්න.

**බෝඹු ඉදල දලු ලා දෝ නොලා දෝ**

..............................................................

..............................................................

..............................................................

ii. ඊට පිළිතුරු වශයෙන් අනෙක් පහුරුකාරයා කියන්නට ඇති සීපදය ලියන්න.